රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය இணைந்த சேவைகள் பிரிவு COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: www.pubad.gov.lk Web Site

---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/අන්තර්ග්‍රහණය
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2017.10.24

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/**

**සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/**

**දිස්ත්‍රික් ලේකම්වරුන්/**

**ප්‍රාදේශීය ලේකම්වරුන්**

<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම</u>

සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කරන ලද නිලධාරීන්, අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු 2017.12.31 දිනට පෙර අවසන් කිරීමට නියමිතව ඇති බැවින්, ඔබ ආයතනයට අනුයුක්තව සේවයේ නියුතු අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කර ඇති නමුත් මෙතෙක් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කර නොමැති නිලධාරීන් සම්බන්ධ තොරතුරු ඇමුණුමෙහි සඳහන් ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර 2017.11.15 දිනට පෙර මා වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

2017.08.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(III) හි සඳහන් පරිදි සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීමට අවස්ථාව සලසා දී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012, 10/2012(I), 10/2012(II) විධිවිධාන යටතේ දැනටමත් මනාපය පළ කර ඇති හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(III) විධිවිධාන අනුව මනාපය පළ කරන නිලධාරීන්ට එම ඉල්ලීම් නැවත ඉල්ලා අස්කර ගැනීමට අවස්ථාව නොමැති බැවින්, අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති සියළුම නිලධාරීන්ගේ තොරතුරු දන්වා එවීමට ඔබගේ විශේෂ අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

තවද, අදාල කටයුතු සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු නම් කර, ඔහු/ඇය සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයක්ද සඳහන් කර එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**කේ.වී.පී.එම්.ජේ.ගමගේ**

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**

සංවර්ධන නිලධාරින් සම්බන්ධ ලිපි යොමු කිරීමේදී අදාල නිලධාරියාගේ පත්වීම් ලිපි අංකය(CS/DOS/XXXXX) සඳහන් කිරීමට කාරුණික වන්න.

ඇමුණුම

<u>අන්තර්ග්‍රහණයට මනාපය පළ කරන ලද මෙතෙක් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොකරන ලද නිලධාරීන් සම්බන්ධ තොරතුරු කැඳවීම</u>

| නම | ජාතික හැඳුනුම්පත් අංකය | නිලධාරියාගේ පෞද්ගලික දුරකථන අංකය | අන්තර්ග්‍රහණයට මනාපය පළ කරන ලද අවස්ථාවේදී සේවා ස්ථානය | අන්තර්ග්‍රහණයට මනාපය පළ කරන ලද දිනය | ✱ වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

තොරතුරු නිවැරදි බව සනාථ කරමි.

...............................................
(ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව)

➢ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද, නමුත් මෙම අවස්ථාව වන විට සේවයේ යෙදී නොසිටින (වෙනත් තනතුරක් සඳහා මුදාහැරීම, ඉල්ලා අස්වීම, මියයාම,විශ්‍රාම ලබා ගැනීම) නිලධාරීන් සම්බන්ධ තොරතුරුද සටහන් කළ යුතු වේ.

✱ සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය සඳහා එවා ඇති ලේඛනවල පවතින අඩුපාඩු ගෙන්වා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් එවන ලද ලිපියේ අංකය සටහන් කරන්න. **(CS/DOS/Absorb/XXXX)**